## කටුනායක සීදූව නගර සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය ව්‍යාවනය

-----------------

මෙම වාර්තාවේ 1.3 හා 2.2 ඡේදවල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන්ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අඩු ආදායම්ලාභී දරුවන් හට පාවහන් ලබා දීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබාදී තිබූ රු. 500,000 ක ණය මුදල ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) කටුනායක සීදූව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු දීමට අදාලව 2017 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු යතුරු කාසි වටිනාකම රු. 2,266,491 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 30 දින ආයතනයට ලැබී තිබූ රු.3,125,700 ක් වටිනා ටැෆේ ට්‍රැක්ටර් දෙකක් හා රු. 652,050 ක් වටිනා ට්‍රේලර් දෙකක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබූ නමුත් ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) ආයුර්වේද මධ්‍යස්ථාන 04 ක එකතුව රු. 264,536 ක් වූ ඖෂධ තොගයක් ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 අවිනිශ්චිත ගිණුම

-------------------

දිගින් දිගටම නිරවුල් නොකර පැවත එන රු.12,051,699 ක් වූඅවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

-----------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 05 ක ඉදිරිපත් කලගිණුම හා ලේඛන/උපලේඛන අතර රු.56,973,501 ක වෙනස්කම් විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ, ඉදිරිපත් කල ගිණුම අනුව රු. 34,702,611 ක්, ලේඛනය අනුව රු. 34,711,957 ක් හා උපලේඛන අනුව රු. 35,771,503 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් ලැබීම්, ගිණුම අනුව රු. 104,856,946 ක් හා ලේඛනය අනුව රු. 108,871,850ක් වූයෙන් රු. 4,014,904 ක වෙනසක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

(i) මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ මගින් දිගින් දිගටම දක්වා තිබූ රු.10,524 ක් වූ අගරු චෙක්පත සඳහා මුදල්අයකර ගැනීමට කටයුතු කරනොතිබුණි.

(ii) වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම ඉදිරියට පැවත එන රු. 61,870 ක අගරු චෙක්පත් ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට රු. 36,535,227 ක් වූ ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණවලින් රු. 23,922,462 ක් පෙර වර්ෂ වලට අදාලව ලැබිය යුතු මුදල් වන අතර ඒවා නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

වර්ෂ ගණනාවක සිට දිගින් දිගටම පැවත එන වටිනාකම රු.1,534,700 ක ඇස්තමේන්තු වාරික ප්‍රාග්ධන වියදම් බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.6 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

විස්තරාත්මක උපලේඛන,ස්ථාවර තැන්පතු සහතික හා අලුත් කිරීමේ නිවේදන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.24,660,572 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කල නොහැකි විය.

1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 | 1,087,367 | නිකුත් කළ නමුත් ගෙවීම සඳහාබැංකුවට ඉදිරිපත් නොකල මාස 06 ඉක්මවා තිබූ චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර මෙයින් වටිනාකම රු.560,393 ක් වූ චෙක්පත් 02 ක් වර්ෂ 3 කට පෙර ඒවා විය. |

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) 3.6.1 | 2,647,200 | නැවත ඇනවුම් කිරීමේදී මුල් ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේ දින සිට හයමසක කාලයක් ඉකුත් වීමට පෙර නැවත එම මිලට ඇනවුම් කිරීම සිදුකළ හැකි වුවත්, සමාලෝචිත වර්ෂයේ පරිගණක 24ක් මිලදී ගැනීමසඳහා, 2015 දෙසැම්බර් මාසයේ තාක්ෂණික ඇගයීම් නිර්දේශයක් පාදක කොට ගෙන තිබුණි. |
| (ii) 1.2.1 හි (අ), (ඇ) හා (ඊ) | - | කෙටි කාල සීමාවක් තුළදී ඉතා වේගයෙන් තාක්ෂණික වෙනස්කම් සහිතවම්ලෙහි ප්‍රමාණාත්මක වෙනස්කම් ඇති කරවන පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග මිලදී ගැනීමේදී උක්ත පරිදි කටයුතු කිරීම හේතුවෙන් මිල හා තාක්ෂණික වාසි ලබාගැනීමට තිබූ අවස්ථාව මගහැරී තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.79,379,143 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,353,763ක් විය.

2.2 මූල්‍ය පාලනය
----------------

(අ) ලංකා බැංකු ජංගම ගිණුමට අදාලව මුදල් පොතේ ශේෂය හා බැංකුවේ ශේෂය සැසඳීම සඳහා හඳුනා ගැනීමකින් තොරව රු.12,536,426 ක් සමුච්චිත අරමුදල හර කර මුදල් ගිණුම බැර කර තිබුණි.

(ආ) මහජන බැංකු ජංගම ගිණුමට අදාලව පිළියෙල කර තිබු බැංකු සැසඳුම් ප්‍රකාශයේ රු.32,582 ක්වූ තැන්පත් නිරවුල් කිරීමකින් තොරව දිගින් දිගටම සටහන් කර තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

3.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` | රු. 000` |
| (i) | වරිපනම් හා බදු | 105,350 | 106,661 | 105,151 | 57,462 | 110,820 | 105,075 | 104,729 | 61,606 |
| (ii) | කුලී | 9,575 | 12,706 | 10,134 | 3,571 | 11,284 | 11,342 | 11,014 | 3,507 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,631 | 2,842 | 2,842 | 66 | 4,317 | 3,256 | 3,256 | 66 |
| (iv) | වෙනත් ආදායම් | 50,372 | 79,688 | 68,707 | 3,020 | 54,487 | 57,159 | 45,654 | 2,882 |

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වර්ෂය ආරම්භයට වරිපනම් හිඟයවූ රු.44,210,218කින් රු.18,029,949 ක් පමණක් වර්ෂය තුළ අය කර තිබූ අතර හිඟ අය කිරීමේ ප්‍රගතිය සියයට 41 ක් විය.

(ආ) ඉකුත් වර්ෂයේ බලපත්‍ර ගාස්තු හිඟයරු.66,000 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයවී නොතිබූ අතර 2018 අගෝස්තු 20 දින වන විට එයින් රු.27,100 ක් පමණක් අය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේවෙනත් ආදායම් බිල් කිරීම ඇස්තමේන්තුව ඉක්මවා සියයට 37ක වැඩිවීමක් වූ හෙයින් ඇස්තමේන්තු කිරීම තාත්වික ආකාරයෙන් සිදු කර නොතිබුණි.

2.3.3 කඩ කුලී

(අ) සීදූව වෙළඳ සංකීර්ණයේ තක්සේරු කඩ කුලිය අය නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයට අහිමිවූ ආදායම රු.400,500 ක් විය.

(ආ) 2013 වර්ෂයේ සිට කඩ කාමර 06 ක කොටස් වශයෙන් අය කරන ලද යතුරු කාසි මුදල් හිඟ ශේෂය රු. 2,266,491 ක්වූ අතර යතුරු කාසි නොගෙවීම හේතුවෙන් එම කඩ ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

----------------

(අ) නාගරික බල ප්‍රදේශයේ පිහිටි සංචාරක සංවර්ධන පනත යටතේ ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි අවන්හල් 02 කින්, තානායම් 02 කින් හා හෝටල් 03 කින් අයකර තිබූ රු.750,884 ක බලපත්‍ර ගාස්තු සඳහා පසුගිය වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගත් මුළු පිරිවැටුමෙන් සියයට 1 ක නොඉක්මවන ගාස්තුවක් හඳුනා ගෙන අයකර ගෙන නොතිබුණි.

(ආ) කාලානුරූපීව බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු සංශෝධනය කර සභාවේ ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, නගර සභා ආඥා පනත යටතේ 1987 දී පනවන ලද බලපත්‍ර හා ව්‍යාපාර බදු කිසිදු සංශෝධනයකින් තොරව එලෙසින්ම සමාලෝචිත වර්ෂය සඳහා ද ක්‍රියාත්මක කර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

----------------

නගරසභා ආඥාපනතේ 4වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛවිහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

-------------------------------------

නගර සභාවෙන් පිටත කිලෝ මීටරයක් පමණ දුරින් කොටස් කර විකුණන ලද ඉඩමක පොදු පහසුකම් සඳහා වෙන් කළ කොටසෙහි2016 ජූලි මාසයේදී රු.2,308,383 ක් වැය කර සභාවේ වාහන නවතා තැබීම සඳහා වාහන නැවතුම් ස්ථානයක් ඉදිකර තිබූ නමුත් 2017 ඔක්තෝබර් 20 දින වනවිටත් මෙම වාහන නැවතුම් ස්ථානය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන වසා දමා තිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන්වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

(අ) වැසි ජල අපවහන ව්‍යාපෘතියට හා පුස්තකාල ඉදිකිරීම් ව්‍යාපෘතියට දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වාරික ආපසු ගෙවීමේදී පිළිවෙලින් රු. 222,817 ක් හා රු.441,788 ක් වශයෙන් වැඩිපුර ගෙවා තිබූ ණය වාරික හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ටයර් හා ටියුබ් සම්බන්ධයෙන් 2017 ඔක්තෝබර් 16 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී බින්පත්‍රයේ පැවති රු.41,770 ක වටිනාකමැති ටියුබ් 11 ක් ගබඩාවේ නොපැවති අතර නව ටයර් හා ටියුබ් නිකුත් කිරීමේදී භාවිතා කළ පැරණි ටයර් හා ටියුබ් භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2016 ජනවාරි 01 දින සිට 2017 ඔක්තෝබර් 20 දින දක්වා ගබඩාවේ ටියුබ් කිසිවක් නොපැවති අතර, 700x16 වර්ගයේ ටියුබ් ප්‍රසම්පාදනය කිරීමට 2017 මාර්තු 24 දින මිලගණන් කැඳවා තිබුණද, සැපයුම්කරුවකු තෝරා ගැනීමට 2017 ඔක්තෝබර් 20 දින විටත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය සඳහා නඩත්තු ඇස්තමේන්තු 35 ක් පිළියෙල කර තිබූ අතර, ඒ සඳහා ද්‍රව්‍ය නිකුත් කිරීමේදී සෑම ඇස්තමේන්තුවකටම සමාන ප්‍රමාණයෙන් චිප්ස් ගල් නිකුත් කර තිබූ හෙයින් එය පිළිගත නොහැකි තත්ත්වයක් විය.තවද ගබඩා ලෙජරයේ ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම්වලට අනුව වටිනාකම රු.74,948 ක් වූ චිප්ස් ගල් කියුබ් 9.14 ක ලැබීම්වලට වඩා වටිනාකම රු.260,678 ක් වූ චිප්ස් ගල් කියුබ් 31.79 ක් නිකුත් කර තිබුණි.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන චක්‍රලේඛය ප්‍රකාරව බස්නාහිර පළාත් පාලන අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සභාව විසින් සීදූව විලේජ් නමැති ඉඩමේ පොදු පහසුකම් සඳහා වෙන්කල කොටසේ බාහිර පුද්ගලයෙකුට ව්‍යාපාර කටයුත්තක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවසරදී තිබුණි. මෙම ඉදිකිරීම් කටයුතු නතර කරන ලෙස පළාත් පාලන කොමසාරිස්2017 මාර්තු 29 දින දන්වා තිබුණි. ඒ අනුව ගොඩනැගිල්ල ඉදිකිරීමට, ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට වූ වියදම හාව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට නොහැකි වීම නිසා ඔහුට සිදුවූ පාඩුව වශයෙන් එකතුව රු.13,712,795 ක් ගෙවන ලෙස දන්වා බාහිර නීතිඥයෙකු මගින් සභාවට නොතීසි නිකුත් කර තිබුණි. තවද මෙම ගොඩනැගිල්ල කුලී ගැණුම්කාර පාර්ශවයට පිරිනැමීමට තීරණය කර තිබියදීත් 2017 පෙබරවාරි 04 දින රු.32,200 ක් වැය කර පුවත්පත් දැන්වීමක් පලකර තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) ප්‍රජාශාලාවක් හා අත් පන්දු ක්‍රීඩා පිටියක් ඉදිකිරීම සඳහා සීදූව අමුණ පාරේ පර්චස් 47.5 ක බිම් කොටසක් 2001 අප්‍රේල් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් නගර සභාව විසින් අත්පත් කරගෙන තිබූ අතර ඒ සඳහා රු.5,000,000 ක වන්දි මුදලක් අදාල ඉඩම් හිමියන්ට ගෙවිය යුතුව තිබුණි.ඉඩම අත්පත් කර ගෙන වසර 17 ක් ඉක්ම ගොස් ඇතත් ඉඩම් හිමියන්ට අදාල වන්දි මුදල් නියමිත කාලයේදී ගෙවීමට සභාව කටයුතු නොකිරීම නිසා වන්දි මුදලට අමතරව සියයට 7 ක පොලියක්ද 2001 අප්‍රේල් 24 දින සිට ගෙවීමට සිදුවන බව අනාවරණයවී තිබුණි.

(ආ) නගර සභාවේ ගොඩනැගිලි අංශය මගින් ක්‍රියාත්මකකොට පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු දඩමුදල් යන අය විෂයයන්වලට අදාලව රැස්කරනු ලබන ආදායම, වාර්තා කිරීම සඳහා එම අංශය තුල ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) මිශ්‍ර ආදායම් අංශයේ ආදායම් වාර්තා කිරීම සඳහා, භාවිතා කරනු ලබන පරිගණක පැකේජයේ පැවති දුර්වලතාවයන් මහ හරවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

---------------------------

තොග සමීක්ෂණය

--------------------

ගබඩාව සම්බන්ධයෙන්2017 ඔක්තෝබර් 16 දින සිදුකල භෞතික පරීක්ෂාවට අනුව භාවිතා කළ නොහැකි මොනිටර් 15 ක් , මධ්‍යම සැකසුම් ඒකක 12 ක් ඇතුළුව පරිගණක,ප්‍රින්ටර් හා ඒ ආශ්‍රිත ඉලෙක්ට්‍රොනික උපාංග බැහැරලීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි

3.5 ප්‍රසම්පාදනය

--------------

කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

කොටුගොඩ නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ කටයුතු පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත ලබා දී තිබූ අතර 2011 ඔක්තෝබර් 12 දින රු.1,814,046 ක රැඳවුම් මුදල් අඩුකර ගැනීමෙන් පසුව ගෙවීම් කර තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසුව කඩ කාමර 10 ක හඳුනාගෙන තිබූ අඩුපාඩු 14 ක් සම්පූර්ණ කර ගැනීම 2018 මාර්තු 31 දක්වාම සිදු කර නොතිබුණි

4. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ආදායම් පාලනය | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ගිණුම්කරණය | ගිණුම්වල ශේෂ වෙනස්කම් පැවතීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ අඩුපාඩු පැවතීම. |
| (ඈ) | වත්කම් පාලනය | පොදු පහසුකම් සඳහා වෙන්කල ඉඩම් ප්‍රයෝජනවත් ලෙස යොදා නොගැනීම. |